www.wsws.org

ලෝක සමාජවාදී වෙබ් අඩවිය

හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# 'සංකල්ප රූපයන් ඔස්සේ සිතන මතන කලාකරුවා, ලෝකය වෙනස් කරනු පිනිස එය ඥානනය කරයි'

## "By thinking in images the artist cognizes the world in order to change it"

***ජීවිතය ජානනය කිරීම වසයෙන් කලාව නමැති කෘතියේ පරිවර්තක ෆෙඩ්රික් චෝටේ නිව් යෝර්ක් නගරයේ දී සිය පරිවර්තන ග්‍රන්ථය අත්සන සහිතව ඉදිරිපත් කිරීමේ අවස්ථාවේ දී පල කරන ලද අදහස්.***

**29 සැප්තැම්බර් 1998**

*සැප්තැම්බර් 25 වෙනි සිකුරාදා ලෝක වෙළඳ මධ්‍යස්ථානයේ බෝර්ඩර් පොත්හලේ දී පවත්වන ලද සමාරම්භක දේශනයෙන් කොටස්:*

පසු ගිය දශක කිහිපය පුරා, සාහිත්‍ය විචාරය බොහෝ දුරට ව්‍යූහවාදය, පශ්චාත් ව්‍යුහවාදය, පශ්චාත්-නූතනවාදය සහ බක්තීන් ලබ්ධික කන්ඩායමක් වටා වූ දේවල්වල ආධිපත්‍යයට නතු වී තිබේ. මාක්ස්වාදී සාහිත්‍ය විචාරය ලෙස සලකනු ලබන ලේඛනවල දී පවා ලූකැෂ්, ඇඩෝනෝ (සහ ෆ්රැන්ක් ෆර්ට් ගුරුකුලයේ සෙසු  අය), රේමන්ඩ් විලියම්ස්, ටෙරී ඊගල්ටන් හෝ ෆ්‍රෙඩ්රික් ජේම්සන් යන නම් ය, වැඩිපුර කියැවෙන්නේ. සෝවියට් සාහිත්‍ය විචාරකයන් බටහිර ගැන ඉතාමත් කලාතුරකින් මිස  බරලතල අවධානයක් යොමු නොකිරීම පුදුමයට කාරනයකි; එම කාරනය නිසා ම ඇලෙක්සාන්දර් වොරොන්ස්කිගේ මෙම ලිපි එකතුව සොම්නස් සහගත විමතියක් ඇති කරයි.

වෝරොන්ස්කි ගැන දන්නේ අල්පයක් වීම අහම්බයක් නම් නොවේ. ට්‍රොට්ස්කි විසින් නායකත්වය දෙන ලද වාම විරුද්ධපක්ෂයට අයත් වීම නිසා ඔහු 1937 දී ඝාතනය කරන ලද අතර නිල සෝවියට් ඉතිහාසයෙන් මකා දමනු ලැබී ය. ඔහුගේ පොත් පුස්තකාලවලින් ඉවත් කරන ලද අතර ඔහුගේ ජීවිතය පිලිබඳ විශ්වාස කටයුතු තොරතුරු සහ සාහිත්‍යය ගැන ඔහුගේ අදහස්වල විකාශනය දැන ගැනීම බොහෙවින් දුෂ්කර විය. ඔහු 1920 ගනන්වල පල වූ සෝවියට් සඟරාවේ සංස්කාරක වසයෙන් කටයුතු කල බවත්, සාහිත්‍ය විචාරකයෙකු ලෙස ස්ටැලින්වාදය මමින් නිහඬ කරවන තුරු, 1921-24 අතර වූ සාපේක්ෂ වසයෙන් කෙටි කාල අතුරුපරාසයේ දී දීප්තිමත් රචනා මාලාවක් ලියූ බව අපි දැන සිටියෙමු.

වොරොන්ස්කිගේ ලිපි ලේඛනවල වැදගත්කම වඩා මැනවින් වටහා ගනු පිනිස ඔහුගේ ජීවිතය පිලිබඳ සාරාංශ සටහනක් ඉදිරිපත් කරනු කැමැත්තෙමි. 1884 දී ටැම්බෝව් ප්‍රාන්තයේ උපන් ඔහු පූජකයකු වීම සඳහා අධ්‍යාපනය ලබමින් සිටිය දී 1904 බොල්ෂෙවික් පත්තරයට බැඳුනේ ය. 1905 දී ඔහු ශිෂ්‍ය කැරැල්ලකට නායකත්වය දුන් අතර ටැම්බෝව් සෙමනේරියෙන් පලවා හරිනු ලැබී ය. වැඩි කල් ගතවීමට පෙර ඇති වූ 1905- විප්ලවයට පීටර්ස්බර්ග් නගරයේ දී ඔහු සම්බන්ධ විය. 1906 දී අත් අඩංගුවට පත් වූ ඔහුට වසරක් සිරගෙයි ලැගීමට සිදු වූ අතර 1907 දී නැවත අත් අඩංගුවට පත් වූ විට දැවුරුද්දක පිටුවහල්වීමකට ලක් විය. 1912 දී ප්‍රාග් සම්මේලනයට සහභාගි වූ ඔහු ලෙනින්, සිනෝවියෙව්, කමනෙව්, ඕර්ජොනිකිඩ්සේ සහ වෙනත් ප්‍රමුඛ බොල්ෂෙවික්වාදීන් මුන ගැසුනේ ය. යලිරුසියාවට පැමින නොබෝ කලකින් නැවත අත්අඩංගුවට පත් වූ ඔහු රටින් පිටුවහල් කෙරින.

1917 පෙබරවාරි විප්ලවයට පසු හේවා-උපප්‍රධානින්ගේ මින්ස්ක්-සම්මේලනයෙහි සහ ඉන් අනතුරුව ඔඩෙස්සාවේ සෝවියට් බලය පිහිටුවීමෙහි ලා ඔහු ප්‍රධාන කාර්යභාරයක් ඉටු කලේ ය. 1918 දී ඔඩෙස්සාව ජර්මානුන් අතට පත් වූ බැවින් ප්‍රධාන රෙදි කර්මාන්ත මධ්‍යස්ථානයක් සහ බොල්ෂෙවික් බලකොටුවක් වූ ඉවානෝවෝ වෙත ඔහු ස්ථාන මාරු කරනු ලැබීය. එහි දී පක්ෂයේ නාගරික කොමිටිය මෙහෙයවූ හෙතෙම 'කම්කරු භූමිය' නම් වූ පුවත්පත සංස්කරනය කලේ ය. 1918 සහ 1920 අතර කාලය තුලදී ඔහු මේ පුවත්පත සඳහා ලිපි 400කට වඩා රචනා කරන ලද අතර එය රුසියාවේ විශිෂ්ටතම ප්‍රාදේශීය පුවත්පත ලෙස විරුදාවලිය ලැබී ය. 1921 දී මොස්කව් වෙත කැඳවනු ලැබූ ඔහු, ලෙනින් කෲප්ස්කයා සහ ගෝර්කි සමග 'රතු නැවුම් පස' නමින් 'බරසාර' සාහිත්‍ය සංගරාවක් ආරම්භ කිරීම සඳහා සාකච්ඡා කාල් ය.

එම සඟරාවේ සංස්කාරක ලෙස ඔහු ගෝර්කි, යෙසිනින්, මායාකොව්ස්කි, පිල්නියැක් සහ මුල් සෝවියට් වකවානුවේ සාහිත්‍ය වංශාවලියේ ලේඛකයන්ගේ කෘති පල කලේ ය. එනමුත් 'නිර්ධන පන්ති සංස්කෘතිය' ව්‍යාපාරයේ සිටි බොහෝ

කොමියුනිස්ට්වාදීන් (බෝහෝ විට තරුන සහ අඩු ඉගෙනුමක් සහිත) ගෙන් ඔහුට කර්කශ විරෝධතා එල්ල විය. නිර්ධනපන්ති සංස්කෘතිකයන් (ප්‍රොලිකුල්ට්වරු) කියා සිටියේ මහා ධනේශ්වර විප්ලව උදාවේ දී ධනේශ්වර පන්තිය නව සංස්කරනයක් නිර්මානය කල අයුරින් සමාජවාදී මිප්ලවය තුලින් බිහි වූ නව පාලක පන්තිය ද නව නිර්ධන පන්තියක් බිහි කල යුතු බව යි.

1922 සහ 1923 අතර කාලය තුල දී ලියන ලද ලිපි මාලාවක් මගින් ට්‍රොට්ස්කි විසින් ප්‍රොලිකුල්ට්වරු විවේචනය කර තිබුනු අතර ඒ ලිපි පසුව 'සාහිත්‍යය සහ විප්ලවය' ලෙස ප්‍රකාශයට පත් කෙරින. ඉදිරි දශක යුද්ධ සහ විප්ලව සහිත කෲර වකවානුවක් වනු ඇති බවත්, ඒ කාලය වන විට ලෝක පරිමානයෙන් බලය දිනා සිටින නිර්ධන පන්තිය, සමාජ පන්තියක් ලෙස අහෝසිවීමට පටන් ගන්නා බවත් ට්‍රොට්ස්කි පැහැදිලි කලේ ය. වෙනත් වචනවලින් කියතොත් එම නව සංස්කෘතිය අලුත්, පන්ති විරහිත සමාජයක් තුල සහෝදරත්වය සහ සමානතාව පිලිබඳ විශ්වසාධාරන මූලධර්මාත්මක පදනම් වනු ඇත. ධනේශ්වර පාලන යුගය තුල සංස්කෘතිය වෙත ප්‍රවිෂ්ටවීමේ මාර්ගය නිර්ධන පන්තිය ඉදිරියේ අවුරා ඇති බැවින් ස්වකීය පන්ති අනන්‍යතාව අහෝසි වී යාමට පෙර නව සංස්කෘතියක් වර්ධනය කිරීමට ඊට කාලයක් ලැබෙන්නේ නැත. කරුනු යෙදී ඇත්තේ ඒ අයුරින් බැවින් සැබෑ, නිර්ධන පන්ති සංස්කෘතියක් පැවතුනේවත් පැවතියහැකි වන්නේ වත් නැත. මෙම ලිපි සංග්‍රහයේඇතුලත් නිබන්ධ කිහිපයක දී වොරොන්ස්කි එම අදහස් ආරක්ෂා කරයි.

1923 දී, වොරොන්ස්කි, '46 ලිපිය' අත්සන් කරමින්, කොමියුනිස්ට් පක්ෂය තුල නිලධාරීකරනය උග්‍ර වීම පිලිබඳ ට්‍රොට්ස්කිගේ විවේචනයට සහාය පල කලේ ය. එම කාලයේ සිට වොරොර්ස්කිගේ ස්ථාවරය ට්‍රොට්ස්කිගේ ස්ථාවරයට සමාන්තරව ගමන් කලේ ය. යුද කොමිසාර් ධූරයෙන් ට්‍රොට්ස්කි පහ කර දැමුනු 1925 ජනවාරියේ දී 'රතු නැවුම් පස' සඟරාවේ සංස්කාරකත්වයෙන් වොරොන්ස්කි ඉවත් කර දැමුනේ ය. සෝවියට් සඟරාවල සිය නිර්මාන පල නොකරන බවට ගෝර්කි සහ යෙසිනින් තර්ජනය කල විට ඔහු නැවත සංස්කාරක තනතුරේ පිහිටුවනු ලැබිනි. 1927, ග්‍රීෂ්ම සෘතුවේ '83 ප්‍රකාශනයට' අත්සන් තබා වැඩි කාලයක් ගතවීමට පෙර 1028 පෙබරවාරියේ ඔහු පත්තරයෙන් නෙරපා හරිනු ලැබී ය. ලිපෙට්ස්ක් වෙත පිටුවහල් කරන ලද ඔහු 1929 ජනවාරි දක්වා අත්අඩංගුවට ගැනුනේ නැත. 'ආපසු අතීතයට' නම් වූ සිය මතක සටහන්වල නඩෙශ්ඩා ජොෆේ සඳහන් කල පරිදි එම වකවානුවේ දී අලුත පැමිනෙන්නන්' 'පිටවී යන්නන්' මගින් සංඛ්‍යාත්මකව පාලනය විය. තමන් වාම විරුද්ධපාර්ශවයෙන් ඉවත් වූ බව දන්වන ලිපියකට අත්සන් කල නිසා 1929 ශරත් සෘතුවේ දී ආපසු මොස්කව් වෙත පැමිනීමට ඔහුට ඉඩ ලැබිනි. 1930 මැයි මාසයේ දී ඔහු නැවත පක්ෂයට ඇතුලත් කර ගන්නා ලදී.

තීව්‍රතර පොලිස් විමසිල්ල නිසා කවර විරුද්ධ පාර්ශ්වීය කාර්යයකට හෝ අවසර තිබුනේ නැතත් අඩු වසයෙන් 1932 පසුවන තුරු වුව ඔහු විරුද්ධ පක්ෂය තුල සිටි බවට සැලකිය යුතු සාක්ෂ්‍ය ඇත. සාහිත්‍ය විචාරකයෙකුලෙස සිය ලිපි පල කිරීමේ අවස්ථාව නොලැබුනත්, රාජ්‍ය ප්‍රකාශන මන්දිරයේ සංස්කරෙක ලේඛකයකු ලෙස කටයුතු කිරීමට ඔහුට ඉඩ ලැබුනේ ය. 1934 දෙසැම්බර්වල සිදු වූ කිරොව් ඝාතනයෙන් පසු අවසන් වරට වොරොන්ස්කි පක්ෂයෙන් නෙරපා හරිනු ලැබීය. 1937 පෙබරවාරි පලමුවෙනි දා ඔහු අත් අඩංගුවට ගන්නා ලද අතර අගෝස්තු 13 දා සිදු කල මිනිත්තු 20ක නඩු ඇසීමෙන් සුලු වේලාවකට පසු මරා දැමිනි. ඔහු 1936-38 අතර මහා ඊිම සමයේ දී ස්ටාලින් විසින් අතුගා දමන ලද මාක්ස්වාදීන්ගේ පරපුරක සාමාජිකයෙක් විය.

වොරොන්ස්කි සිය ලිපි මගින් ආමන්ත්‍රනය කරනු ලබන තේමා රාශියවෙනුවෙන් යුක්තිය ඉටු කිරීමට මට නොහැකි බැවින් ඉන් සමහරක් පමනක් මම සඳහන් කරමි. බිලින්ස්කි සහ ප්ලෙකානොව් අනුව යමින් වොරොන්ස්කි අවධාරනය කරන ලද්දේ කලාව යනු ඥානන විධියක් බවයි. සංකල්ප රූප ඔස්සේ සිතන මතන කලාකරුවා, ලෝකය වෙනස් කරනු පිලිස එය ඥානනය කරයි. ඒ කෙසේ වෙතත්, කලාවේ දී අන්තර්ඥානය සහ උප විඥානය මගින් සුවිශාල කාර්යයක් ඉටු කරනු ලැබේ. මේ අදහස් නිසා ඔහු බර්ගසන්වාදියෙකු හා ෆ්‍රොයිඩ්වාදියෙකු ලෙස චෝදනාවට ලක් විය. (ඔහු එවැන්නන් වූයේ නැත.) ඔහු අවධාරනය කලේ විචාරකයාගේ කාර්යය විය යුත්තේ කලා කෘතියක් තුල පවත්නා සමාජ විද්‍යාත්මක සහ සෞන්දර්යාත්මක අවස්ථා ඇගැයීම බවයි. මෙහි ප්‍රථම සාධකය, එනම් කලාකරුවාගේ පන්ති දෘෂ්ටිකෝනය, සාපේක්ෂ වසයෙන් පැහැදිලි ය.

දෙවෙනි සාධකය, සත්‍යය සමග සෞන්දර්යයට ඇති සම්බන්ධයට අදාල වන බැවින් නිශ්චය කර ගැනීම බෙහෙවින් දුෂ්කර ය. (නිදසුනක් වසයෙන් ව්‍යාජ අදහසකට සුන්දර ආකෘතියක් සොයා යා නොහැකි ය, එසේ නැති නම් එවැන්නක් සොයා ගත හැකිවන්නේ හුදෙක් සීමිත ආකාරයකින්ය. යන ප්ලෙකනොව්ගේ මතය වොරොන්ස්කි ප්‍රතිරාවය කරයි..) වෛශයිකත්වය කෙරෙහි ආත්මීයත්වයේ ඇති සම්බන්ධතාවත්, සමාජිකය සහ පුද්ගලයා අතර සම්බන්ධතාවත් ගවේශනය කල වොරොන්ස්කි, නිර්මානාත්මක ක්‍රියාදාමයේ මනෝ විද්‍යාව වෙත වඩවඩාත් ගැඹුරු ලෙස යොමු විය. මේ සෑම ක්ෂේත්‍රයක දී ම ඔහුගේ අදහස් බොහාමයක් අසම්පූර්නව පවතී. ස්ටැලින්වාදය විසින් ඔහු නිහඬ කර දැමුනේ නැති නම් ඔහු කවර

දිශාවකට යොමු වේ දැයි අපි නොදන්නෙමු. එක දෙයක් නම් පැහැදිලි ය. වොරොන්ස්කි වූ කලී 1934 අගෝස්තුවේ සෝවියට් ලේඛකයන්ගේ පලවෙනි සම්මේලනයේ දී සංහිතාගත කරනු ලැබූ ද, සෝවියට් සාහිත්‍යය මත පොලිස් පොල්ල හෙළීමේ මාධ්‍ය බවට පත් වූ ද, සමාජවාදී යථාර්ථවාදයේ ආදිකර්තෘවරයෙකු නොවේ. එම සම්මේලනයට සහභාගි වන ලෙස කරන ලද ආරාධනය ඔහු ප්‍රතික්ෂේප කලේ ය.

1937 දී වෙඩි තබා මරා දමන විට ඔහු යන්තම් 53 වෙනි වයසේ සිටියේ ය. 1957 දී ඔහු, නිල වසයෙන් 'පුනරුත්ථාපනය' කරන ලද අතර දැඩි ලෙස වාරනයට ලක් කරන ලද ලිපි සංග්‍රහ කිහිපයක් සෝවියට් දේශය තුල පලවිය. ඔහුගේ ප්‍රධාන ලිපි බෙහොමයකින් කපා දමන ලද කොටස් ඉංග්‍රීසි පරිවර්තනය තුල ප්‍රතිසංග්‍රහ කර තිබේ. වොරොන්ස්කි පිලිබඳ තවත් බොහෝ දේ ලිවීමටත්, පැවසීමටත් ඇති බැවින් මේ විශිෂ්ට මාක්ස්වාදී සාහිත්‍ය විචාරකයා ගැනත්, ඒ තරම්ම ශ්‍රේෂ්ට වූ ඔහුගේ ලිපි ලේඛන ගැනත් ඕනෑ ම ප්‍රශ්නයක් මතු කරන ලෙස මම ඔබට ආරාධනය කරමි.

© www.wsws.org